ලිංගික අපයෝජන සිදුවීමක බාලවයස්කාර වින්දිතයාගේ අනන්‍යතාවය කිසිසේත්ම හෙළි නොකළ යුතු බව ජාත්‍යන්තර මාධ්‍ය ආචාර ධර්මයන්හි දැක්වේ. එසේම බාලවයස්කාර වින්දිතයාගේ අනන්‍යතාවය හෙළි නොවී ඇති අවස්ථාවකදී වුවත්, එම සිදුවීමට අදාළ සැකකරු/වරදකරු බාලවයස්කාර වින්දිතයාට ඥාතීත්වයක් ඇති අවස්ථාවකදී, එම ඥාතීත්වය සමගින් සැකකරු/වරදකරුගේ අනන්‍යතාවය හෙළිදරව් කිරීමද නොකළ යුතු වේ. මන්දයත්, ඒ ඔස්සේ බාලවයස්කාර වින්දිතයාගේ අනන්‍යතාවයද හෙළිදරව් වීමට විශාල ඉඩක් පවත්නා බැවිනි.

උදාහරණයක් ලෙසින් මව්බිම පුවත්පතේ පළවූ පහත ප්‍රවෘත්තිය දැක්විය හැක. මෙහි පියෙකු විසින් සිය දියණිය ලිංගික අපයෝජනයට බඳුන් කර ඇති බව දැක්වෙන අතර, එම වරදකාර පියාගේ නම සහ ලිපිනයද පුවත් වාර්තාව තුළ දැක්වී ඇත. මෙවැනි සමාජ ප්‍රශ්නයක් සමාජ කතිකාවකට බඳුන් වීමේ ඉඩකඩ සලකමින් එම ඥාතීත්වය සඳහන් වීම නොසලකා හැරියත්, වරදකරුගේ සහ වින්දිතයාගේ ඥාතීත්වය සමගින් වරදකරුගේ අනන්‍යතාවය හෙළිදරව් කිරීම ඔස්සේ බාලවයස්කාර වින්දිතයාගේ අනන්‍යතාවය හෙළි වීමට පුවත්පත මගින් ඉඩ හැර තිබීම කිසිසේත්ම සුළුපටු කරුණක් නොවේ. එය මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක්ද වෙයි.

එසේම දූෂණය, කෙළෙසීම වැනි යෙදුම් ඔස්සේ වින්දිතයෙකු අපවිත්‍ර වී ඇති බවක් ගම්‍ය වීම සහ ඒ ඔස්සේ වින්දිතයා සමාජය තුළ කොන්වීමකට ලක් විය හැකි බැවින්, එවැනි යෙදුම් වෙනුවට මෙතැනදී වඩාත් යෝග්‍ය වන්නේ 'ලිංගික අපයෝජනය' බවද මෙසේම දක්වමු.
**#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima**